දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

මගේ අංකය )
எனது இல ) ETR/PPO/Ins -T./18/2021 -II
My No. )
ඔබේ අංකය )
உமது இல ) 2022.09/05
Your No. : )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA
සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
**Ministry of Health**

සියළුම ආයතන ප්‍රධානීන් වෙත

**<u>රාජ්‍ය සෞඛ්‍ය කළමණාකරන සහකාර සේවයේ පළමු ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පැය 120 මාර්ගගත (online) පුහුණු පාඨමාලාව - (සිංහල මාධ්‍යය) පළමු කණ්ඩායම - 2022</u>**

උක්ත පුහුණු පාඨමාලාව මාර්ගගත ක්‍රමය (online) ඔස්සේ Moodle තාක්ෂණය භාවිතයෙන් පවත්වා අවසන් කර ඇති අතර එම පුහුණු පාඨමාලාව සාර්තකව නිම කරන ලද නිලධාරීන්ගේ ප්‍රතිඵල ලේඛණය අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ 2022.08.24 දින සිට ප්‍රසිද්ධ කර ඇත.

එම පුහුණු වැඩසටහනෙහි පූර්ව ඇගයීම 2022.05.17 සිට 2022.05.31 දක්වා ත් ඉන්පසු ප්‍රධාන විෂයපථයන් 04 ට අදාලව ලබාදෙන ලද දේශණ සටහන් 40 ක් ලබාදීමෙන් අනතුරුව 2022.07.14 සිට 2022.07.27 දක්වා පසු ඇගයීම ත් පවත්වා අවසන් කරන ලදී.

ඒ අනුව මේ සමග යොමුකර ඇති ආකෘති පත්‍රයට අනුව පුහුණුව සාර්තකව අවසන් කර ඇති ඔබ ආයතනයට අයත් නිලධාරීන්ගේ ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

වෛද්‍ය එච්.ඩී.බී.හේරත්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ)

වෛද්‍ය එච්. ඩී. බී. හේරත්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - (වෛ.බ)
(අධ්‍යාපන පුහුණු හා පර්යේෂණ)
සෞඛ්‍ය අමාත්‍යාංශය
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

මගේ අංකය :- ………………………………………..

(ආයතනයේ නම) :- ………………........………………………

(ලිපිනය) :- ………………………………………………………………………………….

………………………………………………………………………………………

(දිනය) :- …………………………………………

පිටපත්

1. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ)
2. අධ්‍යක්ෂ (පාලන 06)
3. විගණකාධිපති

............................................................ මගින්,

රාජ්‍ය සෞඛ්‍ය කළමණාකරන සහකාර සේවයේ පළමු ශ්‍රේණියේ නිලධාරී,

.........................................................................මයා/මිය/මෙය

**<u>රාජ්‍ය සෞඛ්‍ය කළමණාකරන සහකාර සේවයේ පළමු ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පැය 120 මාර්ගගත (online) පුහුණු පාඨමාලාව (සිංහල මාධ්‍යය) පළමු කණ්ඩායම - 2022</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2020.09.14 දිනැති 2193/7 අති විශේෂ ගැසට් නිවේදනයට අනුව රා.සෞ.ක. සහකාර සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කා.ක.ඉ. පැය 120 පුහුණු පාඨමාලාව සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යාපන පුහුණු හා පර්යේෂණ ඒකකය මගින් මාර්ගගත ක්‍රමය (online) ඔස්සේ Moodle තාක්ෂණය භාවිතයෙන් පවත්වන ලද අතර පහත සඳහන් විෂයයන් ආවරණය කරන ලදී.

| **විෂය** | **කාලය** | **සටහන් ප්‍රමාණය** |
|---|---|---|
| ආයතන කාර්ය හා කාර්ය පටිපාටික රීති | පැය 35 | සටහන් - 12 |
| රාජ්‍ය මූල්‍ය කළමණාකරණය | පැය 35 | සටහන් - 12 |
| කාලීන ප්‍රවනතා | පැය 25 | සටහන් - 08 |
| සෞඛ්‍ය ආයතන හා රෝහල් පරිපාලනය | පැය 25 | සටහන් - 08 |
| **සම්පූර්ණ පාඨමාලාව** | **පැය 120** | **සටහන් - 40** |

උක්ත පුහුණු පාඨමාලාවට අදාලව 2022.05.17 සිට 2022.05.31 දක්වා පවත්වන වන ලද පූර්ව ඇගයීම හා 2022.07.14 සිට 2022.07.27 දක්වා පවත්වන ලද පසු ඇගයීම ඔබ විසින් සම්පූර්ණ කරන ලදුව එම පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කර ඇති බව සෞඛ්‍ය අමාත්‍යාංශ නිල වෙබ් අඩවියට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පුහුණු හා පර්යේෂණ ,පනඅධ්‍යා) විසින් 2022.08.දින නිකුත් කර ඇත 240 ප්‍රතිපල ලේඛනයේ අනු අංක ............... යටතේ ඇති ප්‍රතිඵලය අනුව සනාථ වේ.

මේ අනුව රා.සෞ.ක.ස.සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන් විසින් සම්පූර්ණ කළ යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2022.05.17 සිට 2022.07.27 කාලය තුළ ඔබ විසින් සම්පූර්ණ කර ඇති බව සතුටින් දන්වමි.

(අත්සන) ........................................................

(ආයතන ප්‍රධානියාගේ තනතුර) ........................................................

(ආයතනයේ නම) ........................................................